**ශීර්ෂය 199 - සමාජ සුහසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය**

**-------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

සමාජ සුහසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජ සුහසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සමාජ සුහසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කලට සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු වටිනාකම හා මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු වටිනාකම අතර වෙනස පෙන්වීමට අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතු වුවත් එම ශේෂ දෙක අතර රු.873,980, ක ශුද්ධ වෙනස පෙන්වීමට අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අක්මුදල් ගැලපුම් ගිණුමක් වෙනම සකස් නොකරනු ලබන අතර පියවීම් ගැලපීම් සිගාස් පරිගණක වැඩසටහන තුල සිදු වේ. |

### 1.6.2 බැදීම් හා බැරකම්

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.264,944 ක් වටිනා බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පුහුණු වැඩසටහනක් 2018 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර එම වැඩසටහන සති අන්ත දින 16 ක් පැවැත්වෙනු ඇත.<br>එම පාඨමාලාව 2018 වර්ෂයේ ප්‍රතිපාදන හා 2019 වර්ෂයේ ප්‍රතිපාදන වලින් සිදුකිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර ඇත.<br>ඒ අනුව එම වැඩසටහන 2018 හා 2019 වර්ෂවල දින 16 ක් අඛණ්ඩව පැවැත්වෙන බැවින් එම ගෙවීම 2019 වර්ෂයට අදාල වනු ඇත. |
| (ii) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 3.4 ඡේදය ප්‍රකාරව සටහන් අංක (iii) යටතේ වන බැදීම් හා බැරකම් | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් | 2018 භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත මගින් දක්වා ඇත්තේ 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන තිබියදී අග්‍රිම නොලැබීම නිසා ඇති |

| | | |
|---|---|---|
| ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතු වුවත් සටහන් අංක (iii) හි දැක්වෙන වැය විෂයයන් 13 ක රු.2,885,673 ක් වූ බැරකම් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වූ බැදීම් හා බැරකම් වන බැවින් එවැනි චක්‍රලේඛවලට පටහැනි වීමක් සිදුවී නොමැත. |

## 1.6.3 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------ | ------------------------------------ |
| මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු හැකි ඉක්මනට ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වුවද වර්ෂයකට අධික කාලයක් ඉක්මවා තිබූ රු.6,657,705 ක් වූ තැන්පතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ආපසු ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී ඇතත් ප්‍රමාණවත් අග්‍රිම ලැබී නොතිබීමෙන් නිරවුල් කිරීමට නොහැකි වී ඇත. අග්‍රිම ලද පසු නිරවුල් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. |

## 1.6.4 දේපල පිරියත හා උපකරණ

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ----------------------------------- |
| **(i)** | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණවල ආරම්භක ශේෂය ලෙස රු.12,602,306 ක් දක්වා තිබුණද ,**ACA 6** ආකෘතිය අනුව එම අගය රු.106,634,548 ක් විය. | අදාල ගැලපුම් නිසි පරිදි සිදු කර ආරම්භක ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගිණුම්ගත කළ යුතු වීම. | 2018 නව අමාත්‍යාංශයක් ලෙස පිහිටුවන ලද බවත් ඒ අනුව පෙර තිබූ අමාත්‍යාංශය යටතේ වූ දේපල හා පිරියත නව අමාත්‍යාංශය වෙත පවරාගෙන ඇතත් 2017 වර්ෂයේදී එය තක්සේරු කර ගිණුම්ගත නොවූ බැවින් එම ගැලපුම් සිදුකරන කරන ලදී. ඒ අනුව 2018 ජනවාරි 01 දිනට ACA 6 හි ශේෂය අඩුවෙන් සටහන් කර ඇත. |
| **(ii)** | සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර වත්කම් විකුණුම්වලින් ලද මුදල් රු.595,032 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරම් යටතේ එය | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම. | ස්ථාවර වත්කම් විකුණුම් වලින් ලද ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස ගිණුම් ගත කර ඇත. |

දක්වා නොතිබුණි.

### 1.6.5 අධිවැය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම්වලට නොඑළඹිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ඉතිරිය ඉක්මවා වැය විෂයයන් 05 ක් සඳහා රු.1,664,470 ක බැරකම් සඳහා බැඳී තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශිර්ෂ 199 යටතේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී වාර්ෂික විසර්ජන පනතින් වෙන් කල ප්‍රතිපාදන සීමාවන් තුල වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් අග්‍රිම මුදල් නොලැබීම හේතුවෙන් රු.මිලියන 2.518 ක බැඳීම් හා බැරකම් ඇති වී තිබුණි. ඒ සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන හා අග්‍රිම ලබා දීමට කටයුතු කර තිබු අතර එය නිසි පරිදි ඉටුකර ගත නොහැකිවීම නිසා අදාල බැඳීම් හා බැරකම් 2018 වර්ෂය සඳහා ලැබු තිබු ප්‍රතිපාදන සීමාවන් තුල දැරීමට සිදු විය.<br><br>ඒ අනුව 2018 වර්ෂයේදී ද එවැනිම තත්වයක් ඇති වීම හේතුවෙන් අග්‍රිම නොලැබීම නිසා වැය විෂයන්ගේ බැදීම් හා බැරකම් ඇති විය. ඒ අනුව 2018 වර්ෂයේ වෙන්කල ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වැය බැදීම් ඇති වී ඇත. එම තත්ත්වය අත්‍යාවශ්‍ය වැය දැරිම් හේතුවෙන් සිදුවන වැය බැදීම් නිසා මූල්‍ය කළමණාකරණයේදී නොවැලැක්විය හැකි තත්ත්වයක් බවට පත්වී ඇත. |

### 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) පරිදි සේවක ඇප තැන්පතු ලේඛනය පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැන්පතු ලේඛනය නඩත්තු කිරීමට කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය සේවා ඇපකාර සංගමයේ සාමාජිකත්වය ලබාගැනීමට අයදුම් කර ඇත. සාමාජිකත්වය ලද පසු ඇප තැන්පතු ලේඛනය නඩත්තු කරනු ඇත. |

### 1.6.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය** | විශ්‍රාම ගැනීමට පෙර මුළු ණය මුදලම ආපසු ගෙවා අවසන් කරන බවට හෝ විශ්‍රාම ගන්නා අවස්ථාවේදී තම විශ්‍රාම වැටුප පරිවර්තනය කර ආපසු ගෙවීමට ඇති ණය ශේෂයක් වෙතොත් එම ශේෂය තමාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට බලය දෙන බවට ලියන ලද පොරොන්දුවකට නිලධාරියා අත්සන් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේයේ 4.2.3 වගන්තිය අනුව කටයුතු කිරීම. | මෙම අමාත්‍යාංශයේ සේවය කරනු ලබන නිලධාරින්ගෙන් වැඩි ප්‍රමාණයක් නවක නිලධාරින් බැවින් ඔවුන්ට ණය අත්තිකාරම් ප්‍රදානය කිරීමේදී පොරොන්දු පත්‍ර ලබා ගෙන නොමැත. විශ්‍රාම ගැනීමට ආසන්න මට්ටමේ සිටින නිලධාරින්ගෙන් පොරොන්දු පත්‍ර ලබාගෙන ඇත. |
| **(ii)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | **මුදල් රෙගුලාසි 1646** | වාහන භාර නිලධාරියා විසින් මාසයකට පසු එළඹෙන මාසයේ 15 දිනට ප්‍රථම මාසික සාරාංශ මුල් පිටපත් සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් වාහන 15 ක් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දෛනික ධාවන සටහන් ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇති අතර එම තත්වය මේ වන විට යාවත්කාලීන වී ඇත. |
| (iii) | **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | | |

----------------

| | | | |
|---|---|---|---|
| **2006 පෙබරවාරි 21 දිනැති අංක CSA/2/3/4 දරන චක්‍රලේඛයේ 2.2.2 වගන්තිය** | අමාත්‍යවරයෙකුට එක් වර්ෂයක් තුල යා හැකි විදේශ ගමන් සංඛ්‍යාව නිල ගමන් 05 ක් සහ පුද්ගලික ගමන් 05 ක් වශයෙන් දක්වා තිබුණද, අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය තුල විදේශ නිල ගමන් 12 ක නිරත වී තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අමාත්‍යවරයාගේ එක් වර්ෂයක් තුලදී යා හැකි විදේශ ගමන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඇතුලත් කරමින් විදේශ ගමන් අයදුම්පත් ඉදිරිපත් කර ඇතත් එම සංඛ්‍යාව පිළිබඳ නොසලකා ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් අනුමත කර ඇත. |

(iv) **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

-----------------

| | | | |
|---|---|---|---|
| **2018 නොවැම්බර් 28 දිනැති අංක 276/2018දරන චක්‍රලේඛයේ 3.4 ඡේදය** | භාණ්ඩාගාරයට වාර්තා නොකළ බැරකම් කිසිවක් 2019 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වුවද එයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ එසේ වාර්තා නොකළ රු.2,885,673 ක් වටිනා බැරකම් 2019 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත. එහෙත් 2018 භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත මඟින් දක්වා ඇත්තේ 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන තිබියදී අග්‍රිම නොලැබීම නිසා ඇති වූ බැදීම් හා බැරකම් වන බැවින් එවැනි චක්‍රලේඛවලට පටහැනි වීමක් සිදුවී නොමැත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමණාකරණය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------------- | ------------ | -------------------------- |
| **(i)** | පුනරාවර්තන වැය විෂයයන් 03 ක එකතුව රු. මිලියන 1.2 ක් හා රු.200,000 ක් වූ ප්‍රාග්ධන වැය විෂයයක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබිණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය සඳහා බත්තරමුල්ල ප්‍රදේශයේ කාර්යාල ඉඩකඩ පහසුකම් ලබා ගැනීමට නොහැකි වීම මත |

| | | | |
|---|---|---|---|
| | | | සුහුරුපාය ගොඩනැගිල්ලෙහිම ස්ථාපිත කිරීමට සිදු වීම නිසා. |
| **(ii)** | එමෙන්ම පුනරාවර්තන වැය විෂයයන් 08 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක එකතුව වූ රු.මිලියන 991.27 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන ඉතිරි වීම් සියයට 10 ත් සියයට 99 අතර පරාසයක් තුල පැවතුණි. | එම | ජලය, විදුලිය, තැපැල් හා දුරකථන ගාස්තු ගොඩනැගිලි හා වාහන නඩත්තු හා උපකරණ මිලට ගැනීම සඳහා ප්‍රමාණවත් ඉල්ලීම් නොලැබීම මත. |
| (iii) | වැය විෂයයන් 05 ක එකතුව රු.මිලියන 2.45 ක් වූ පරිපූරක ඇස්තමේන්තු මඟින් සපයාගත් සම්පූර්ණ අතිරේක මුදල් ප්‍රමාණයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතු වීම හා මුදල් අවශ්‍යතාවය පිළිබඳ නිසි අධ්‍යයනයකින් යුතුව පරිපූරක ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම. | සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලනය හා ආයතනයේ කටයුතු සඳහා වෙන් කළ ප්‍රතිපාදන වියදම් දැරීම සීමාසහිත වීම නිසා. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම සහ පියවීම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ---------------------------------- | ----------- | ----------------------------------- |
| (i) | මුදල් රෙගුලාසි 371 (ඇ) හි සඳහන් පරිදි අතුරු අග්‍රිම දීම හුදෙක් මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවද මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 18 කදී එකතුව රු.209,514 ක් වූ අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. | මුදල් රෙගුලාසි 371(ඇ) අනුව කටයුතු කළ යුතු වීම. | මාණ්ඩලික නිලධාරීන් හතර දෙනෙකු පමණක් සිටින අතර ව්‍යාපෘති හා වැඩසටහන්වල කාර්ය සාධනය විධිමත් පරිදි පවත්වාගෙන යාම සඳහා ප්‍රමුඛ අවශ්‍යතාවය මත මාණ්ඩලික නොවන නිලධාරීන්ටද අත්තිකාරම් නිකුත් කර ඇත. |
| (ii) | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිම කර දින 10 ක් ඇතුලත ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් අවස්ථා 62 කදී ලබාගෙන තිබුණු රු.මිලියන 2.54 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම ඉහත සඳහන් කාලසීමාව ඉක්මවා දින 11 සිට දින 282 ක කාල පරාසයක් තුල නිරවුල් කර තිබුණි. | මුදල් රෙගුලාසි 371(5) අනුව කටයුතු කළ යුතු වීම. | මෙම අමාත්‍යාංශයේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති වල ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන් වෙත නිකුත් කර ඇති අතුරු අග්‍රිම පියවීමේදී මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව ප්‍රමාදයන් සිදුවී ඇත. ඉදිරියේදී උපදෙස් ප්‍රකාරව අතුරු අග්‍රිම පියවීම සඳහා සැලසුම් කර ක්‍රියාත්මක කරනු ඇත. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධව ගැලපුම් කිරීමේදී වූ ඌනතාවයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත්, එම සැලැස්මේ පහත විස්තර ඇතුළත් කර නොතිබුණි. | | |
| (i) අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අනුමත කාර්ය මණ්ඩලය හා ප්‍රවර්තන වර්ෂයේ සත්‍ය කාර්ය මණ්ඩල වාර්තාව සකස් කර භාණ්ඩාගාරයට ලබා දී ඇත. |
| (ii) අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා. | එම | මෙම අමාත්‍යාංශය සඳහා වෙන්කල ප්‍රතිපාදන සීමාවන් තුල අනුමත අග්‍රිම සැලැස්ම සකස් කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ලබාදී ඇත. |
| (iii) අමාත්‍යාංශය විසින් සැලසුම් කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම. | එම | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා ජාතික ප්‍රසම්පාදන කොමිසමට ඉදිරිපත් කර ඇත. |

### 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කෘෂි මාර්ග හරහා ඇති පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා (දමන) රු. මිලියන 38 ක ප්‍රතිපාදන වෙන්කර අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත අදාල ප්‍රතිපාදන නිදහස් කර තිබුණද රු.මිලියන 37.6 ක ප්‍රතිපාදන ආපසු එවා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. | කෘෂි මාර්ග හරහා ඇති පාලම් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියට රු.මිලියන 38 ක් 2018 නොවැම්බර් මස ලබාදී ඇත. මෙම ව්‍යාපෘති මධ්‍ය ප්‍රමාණයේ ව්‍යාපෘති බැවින් මාස 3-6 දක්වා කාල පරාසයක් තුල ව්‍යාපෘති ආරම්භ කිරීමට ගතවන බැවින් හා වර්ෂ අවසානයේ අග්‍රිම ලබාගැනීමට පවතින ගැටළු සහගත තත්ත්වය සලකා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ගිවිසුම්වලට එළඹීමට නොහැකි විය. |

### 3.3 කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කෘෂිකාර්මික නවීකරන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ව්‍යාපෘති පාලන කමිටු සාමාජිකයන් සඳහා දීමනා ගෙවීම** | | |
| කළමණාකරණ සේවා චක්‍රලේඛයෙහි 9.4 පරිච්ඡේදය අනුව Steering Committee යේ සාමාජිකයින් එම රැස්වීමට සහභාගී වීම වෙනුවෙන් ගෙවිය යුතු දීමනාව එක් අවස්ථාවකට රු.3,000 ලෙස සඳහන් කර තිබියදී මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති තනතුර සඳහා එක් රැස්වීමකට රු.15,000 ක් ද, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ රැස්වීම් වාරයකට රු.10,000 ක් ද ලෙස දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ සඳහා කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර පරීක්ෂා කර සිහි කැඳවීම් සිදු කර ඇත. නිසි පිළිතුරක් ලැබී නැත. මේ සඳහා එවකට ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දුන් අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇත. අනුමැතිය ලබාගැනීමට දැනටමත් කටයුතු කරමින් පවතී. |
| **(ආ) G.S.I මෘදුකාංග පැකේජය මිලදී ගැනීම** | | |
| ව්‍යාපෘතියෙහි කටයුතු පහසු කිරීමට හා දත්ත G.S.I ගබඩාවක් ලෙස පවත්වාගෙන යාම සඳහා රු.මිලියන 4.25 ක මුදලකට 2017 දෙසැම්බර් 22 දින මිලදී ගත් G.S.I මෘදුකාංග පැකේජය 2019 ජනවාරි 08 දින දක්වා ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තබා තිබුණි. මෙම පැකේජය ක්‍රියාත්මත කරවීම සඳහා කෘෂිකර්ම අංශයේ නවීකරන ව්‍යාපෘතියෙහි නිලධාරින් 05 දෙනෙකු පැකේජය මිලදී ගත් ආයතනය මඟින් පුහුණු වීම් කර තිබුණි. නමුත් මෙම පැකේජයෙන් ප්‍රයෝජනයක් ගැනීම සඳහා ව්‍යාපෘතියෙහි ඉහළ කළමණාකරණය විසින් පුහුණු වීම් ලද නිලධාරින් වෙත වගකීම් පවරා අධීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. | වැය කරනු ලබන මුදලින් උපරිම ඵලදායීතාවයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | උපදේශකයෙකු බඳවා ගැනීමට අවස්ථා 02 කදී කටයුතු කළද ගෙවීමට යෝජනා කර තිබූ මාසික දීමනාව රු.150,000 ක් වීමෙන් සුදුස්සකු සොයා ගැනීමට අපහසු වී තිබුණි. දැනට මේ සඳහා උපදේශකයෙකු ඉදිරිපත් වී ඇති අතර සමීප කාලයේදී බඳවා ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | | කරනු ලැබේ. |
| (ඇ) | කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියේ කාලසීමාව 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වසර 05 ක් වන අතර ඒ අනුව 2017 සහ 2018 වර්ෂවල ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තු පිළිවෙලින් රු.මිලියන 1459 ක් හා රු.මිලියන 1824 ක් වුවද එම වර්ෂවල තථ්‍ය වියදම රු.මිලියන 293 ක් හා රු.මිලියන 340 ක් පමණක් විය. එමෙන්ම මෙම වියදමට සමානව ප්‍රාග්ධන ගැලපුම් ප්‍රධානයන් ලබන ආයෝජකයින් වැය කළ යුතු ඇ.එ.ජ.ඩො.මිලියන 44.10 ක ප්‍රමාණය වැය කිරීම පිළිබඳ විස්තර ව්‍යාපෘතියේ නොවූ අතර එම මුදල් වැය කරන ආකාරය සම්බන්ධ විස්තර ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන විට සැලකිල්ලට ගෙන නොතිබුණි. | සැලසුම් වලට අනුව ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරිපත් කර ඇති සංඛ්‍යා දත්ත නිවැරදි වේ. කෙසේ වෙතත් සියළු ප්‍රතිපාදන ව්‍යාපෘතියේ සංරචක අංක 01 සහ 02 සඳහා ලබා දී ඇත. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ----------- | -------------------- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.8 (ආ) ඡේදය අනුව විෂයය පිළිබඳ විශේෂඥයෙකුගෙන්/ විශේෂඥයන්ගෙන් සහ ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන්ද තාක්ෂණ ඇගයීම් කමිටුව සමන්විත විය යුතුය. එහෙත් 2018 වර්ෂයේ පැවති INCO (The Institution of Incorparated Engineers) ප්‍රදර්ශනය සඳහා හා ඉදිරියේදී පැවැත්වීමට නියමිත ප්‍රදර්ශන සඳහා ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් ප්‍රදර්ශන කුටියක් සැකසීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී එසේ කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති සඳහා විෂය දැනුම සහිත නිලධාරින් පත් කිරීමට උපදෙස් දී ඇත. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------------- |
| අමාත්‍යාංශයේ කාර්යාල පවත්වාගෙන යාම සඳහා බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ 16 වන මහල ලබා ගෙන තිබියදී අපනයන කෘෂිකර්ම අංශය හා විදේශ වෙළඳ සම්බන්ධතා අංශය පවත්වාගෙන යාම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 18 වන මහලේ වර්ග අඩි 4,850 ක ප්‍රමාණයක් කුලී පදනමට 2017 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට 2019 වර්ෂයේ අප්‍රේල් මස දක්වා ලබාගෙන තිබුණි. ඒ අනුව පිළිවෙලින් 2017 සහ 2018 වර්ෂය සඳහා කුලිය, විදුලිය හා දුරකථන පහසුකම් සඳහා පිළිවෙලින් රු.18,941,635 ක් සහ රු.21,539,290 ක මුදලක් වැය කර තිබුණද 2018 වර්ෂයේ අප්‍රේල් සිට අගෝස්තු මස දක්වා දේශීය සම්මන්ත්‍රණ 03 ක් හා විදේශීය සම්මන්ත්‍රණ 03 ක් පවත්වා තිබුණි. එමෙන්ම 2018 වර්ෂයේ සැප්තැම්බර් මාසයෙන් පසුව මෙම පරිශ්‍රය කිසිදු කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට නොගෙන අපනයන කෘෂිකර්ම අංශය පමණක් පවත්වාගෙන ගොස් තිබුණද 2019 අප්‍රේල් 30 දිනෙන් පසුව එම අංශයේ කටයුතු විසුරුවා හැරීමෙන් දරන ලද වියදම ඌන උපයෝජිතව පැවතුණි. | රජයේ අරමුදල් උපරිම කාර්යසාධනයෙන් අරපිරිමැස්මෙන් ඵලදායීතාවයෙන් යුක්තව වැය කළ යුතු වීම. | මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අපනයන කෘෂිකර්මය හා විදේශ වෙළඳ සම්බන්ධතා අංශය සුහුරුපාය ගොඩනැගිල්ල තුල පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොතිබු බැවින් ගොඩනැගිල්ලක් කුලියට ලබා ගැනීමට තීරණය කරන ලදී.<br><br>මෙම ගොඩනැගිල්ල 2017 වර්ෂයේ අප්‍රේල් මස කුලී පදනමට ලබා ගෙන ඒ සඳහා 2017/2018 සඳහන් 2018/2019 අප්‍රේල් 30 දක්වාත් ගිවිසුම් වලට එළඹී තිබිණි.<br><br>එම අංශය සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ සියළුම මෙහෙයුම් කටයුතු සිදු කල අතර 2018 වර්ෂයේ සිදුවු අමාත්‍යාංශ සංශෝධනය නිසා එම කාර්යාලය සෙත්සිරිපාය II අදියර වෙත ගෙන එන ලදී. 2019 අප්‍රේල් 30 දිනෙන් එම අංශයේ කටයුතු විසුරුවා හැරීමට කටයුතු කරන ලදී. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------------------- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට 2017 අංක 19 දරණ | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම සඳහා 2016 වර්ෂයේදී ආරම්භ කර ඇත. ඒ අනුව 2016 - 2030 කාලපරිච්ඡේදය තුලදී ශ්‍රී ලංකාවේ |

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන පනත අනුව එක් එක් රාජ්‍ය ආයතන බැඳී පැවතුණද අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක නිශ්චිතවම ඉදිරිපත් කර නොතිබුණි. එම අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමනය කිරීම සඳහා දර්ශක හඳුනා ගැනීම, පාදක දත්ත හඳුනා ගැනීම හා වාර්ෂික ඉලක්ක හඳුනා ගැනීම හා එහි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම වැනි කාර්යයන් ඉටු කර නොතිබුණි. | කටයුතු කළ යුතු වීම. | අපනයන බෝග විවිධාංගීකරණය හා අපනයන කෘෂිකර්මාන්ත අංශයේ නියැලි පුද්ගලයන් හා ආයතනවල අපනයන බෝග හා කුළුබඩු අංශයේ ආදායම සංවර්ධනය තුලින් ජාතික ආදායමෙහි අපනයන කෘෂිකර්මයට හිමි ස්ථානය සියයට 30 කින් ඉහල නැංවීම සඳහා සැලසුම් සකස් කර දැනටමත් ක්‍රියාත්මක කර ඇත. |

## 5 යහපාලනය

### 5.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති DMA/2009(1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයක් තුළ කාර්තුවකට 01 බැගින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරියකු පත් කර තිබූ අතර 2018 වර්ෂයේ වරින්වර සිදුවූ අමාත්‍යාංශ සංශෝධන හේතුවෙන් පැන නැගුන පරිපාලනමය ගැටළු සහගත තත්ත්වයන් හේතුකොට ගෙන විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් කෘෂිකර්ම අමාත්‍යාංශයේදී පැවැත්වුණි. ඒ සඳහා ප්‍රධාන ගණකාධිකාරී හා අනෙකුත් නිලධාරීන්ද සහභාගී වී ඇත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටම, තෘතීයික මට්ටම, ද්විතික මට්ටම හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 23 ක් පැවතියද එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | අනුමත කාර්යමණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හෝ අතිරික්ත තනතුරු වේ නම් කාර්යමණ්ඩල සංඛ්‍යාව සංශෝධනය කරවා ගැනීම. | මේ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දීම හා සාකච්ඡා සිදුකිරීම මඟින් 2018 වර්ෂය සංවර්ධන නිලධාරින් 06 දෙනෙකු හා කළමණාකරණ සහකාර 10 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටම සඳහා නිලධාරින් බඳවා ගැනීම සඳහාද කටයුතු සිදු වෙමින් පවතිනු ඇත. |